**ශීර්ෂය 130- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 02 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

## 2.1 විසර්ජන ගිණුම

----------------

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,072.96 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,887.18 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 185.78 ක් හෙවත් සියයට 8.96 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,092.31 | 1,048.87 | 43.44 | 3.98 |
| මූලධන | 980.65 | 838.31 | 142.34 | 14.51 |
| **එකතුව** | **2,072.96** | **1,887.18** | **185.78** | **8.96** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.02.01.01 සඳහා එකතුව රු.මිලියන 700.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 727.33 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 103.90 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.02.01.01 | 700.00 | 727.33 | 27.33 | 3.90 |

**2.3 අත්තිකාරම් ගිණුම**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 13001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50.00 | 29.95 | 25.00 | 25.53 | 200.00 | 86.31 |

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 23.33 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0056/000 | 0.87 |
| 6000/0000/00/0002/0074/000 | 0.60 |
| 6000/0000/00/0013/0045/000 | 1.40 |
| 6000/0000/00/0016/0025/000 | 20.43 |
| 6000/0000/00/0018/0033/000 | 0.03 |
| **එකතුව** | **23.33** |

## 2.5 විගණන නිරීක්ෂණය

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

#### 3.1.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 09 ක් සඳහා සළසා තිබුණු එකතුව රු. 70,085,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි .

(ආ) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක සිට සියයට 91 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් කාර්ය මණ්ඩල පුහුණු කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 24 කට ලබාදුන් රු.5,107,672 ක ප්‍රතිපාදනයෙන් රු.785,028 ක් උපයෝජනයට ගෙන නොතිබුණි. තවද, අනුරාධපුර හා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දුන් රු.372,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඈ) 2014 ජනවාරි 01 දිනැති අයවැය චක්‍රලේඛ අංක 2014/01 පරිදි රාජ්‍ය සේවකයන්ගේ පුහුණුව හා හැකියා වර්ධන සඳහා වියදම රු 4,019,669 ක් කාර්ය මණ්ඩල පුහුණු වැය විෂයයට හර කළ යුතු වුවත් එම වියදම විදේශ ගමන් වියදම් වැය විෂයයට හර කර තිබුණි. කාර්යය මණ්ඩල පුහුණු වැය විෂයයේ සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරිය රු.1,683,410 ක් වූ බැවින් නියමිත පරිදි වියදම ගිණුම් ගත වූවා නම් වැය විෂයයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

## 3.2 ආදායම් ගිණුම්

----------------

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 20.02.01.01 හි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.216,564,613 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරාසයට අදාළ විය. එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) මුදල් රෙගුලාසි (2)128ප්‍රකාරව 20.02.01.01ආදායම් සංකේතයට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම අඩුවීම රු.මිලියන 24.2 ක් වී තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

--------------------------------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,922,263 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

-------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

--------------------------------------

2015 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි**.**

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හැර අනෙකුත් පාර්ශවයන්ට ලබාදුන් නිවාස 61 කින් හිඟ හිටි කුලිය රු. 48,451,133 ක් වී තිබුණි. ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.1 වගන්තිය හා 7.2 වගන්තිය අනුව කුලිය හා දණ්ඩන අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ඇ) **බේරුම් නොකළ බැරකම්**

මුදල් රෙගුලාසි 94 විධිවිධානවලට පටහැනිව අවස්ථා 18කදී වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා රු.3,247,147 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**නීතිරීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XIX පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය | - | නිලධාරීන් 07 දෙනෙකුට ලබාදී තිබුණු නිවාසවලින් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 6.1 හා 7.1 වගන්ති | - | නිල නිවාස 04 ක පදිංචිකරුවන් වර්ෂ 5 කට අධික කාලයක සිට පදිංචි වී සිටියත්, ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර එම පදිංචිකරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104(4) | 1,705,386 | වර්ෂ 5කට වැඩි කාලයක් ඉක්මවා තිබුණු අලාභහානි 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**(ඇ)** **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2007 අප්‍රේල් 20 දිනැති අංක 22/2006 දරන චක්‍රලේඛයේ iv,v,vi, හා vii ඡේදය | 3,262,337 | අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති නිල නිවාස 62 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.6 විදේශාධාර ව්‍යාපෘති

දුෂ්කර ප්‍රදේශයන්හි ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ධාරිතා සංවර්ධනය සඳහා UNDP ව්‍යාපෘතියක් යටතේ "යහපාලනය සඳහා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය" අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා ප්‍රදාන වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 29.015 ක් ලබා දීමට එකඟ වී තිබුණි. එයින් ඇමරිකානු ඩොලර් මිලියන 2.673 ක් UNDP ව්‍යාපෘතිය මඟින්ද, ඇමරිකානු ඩොලර් මිලියන 26.342 ක් වෙනත් ප්‍රදාන වශයෙන්ද ලැබිය යුතුව තිබුණත්, UNDP ව්‍යාපෘතියෙන් පමණක් අරමුදල් ලැබී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී තිබූ ප්‍රදාන වටිනාකම ඇමරිකානු ඩොලර් 692,716 ක් වූ අතර මෙම ව්‍යාපෘති කාලය වර්ෂ 2013 සිට 2017 දක්වා වී තිබුණි. 2015 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.15,000,000 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.13,441,896 ක් උපයෝජනය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ත්‍රෛමාසික කාර්යයසාධන වාර්තා විගණනයට ඉදිරිපත් නොවූ බැවින් ව්‍යාපෘතියේ කාර්යසාධනය පිළිබඳව පරික්ෂා කිරීමට නොහැකි විය.

(ආ) ව්‍යාපෘතියේ මුළු කාලසීමාව මාස 53 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට මාස 29 ක් ගත වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ කාල සීමාවෙන් සියයට 55 ක කාලයක් ගත වී තිබුණත්, මුළු ප්‍රදානවලින් සියයට 26 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.7 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබූ වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත අරමුණු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක කර තිබූ ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය දක්වා තිබුණද එම අගයන් තහවුරු කර ගැනීමට පදනම් වන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණු නිසා ප්‍රගතියේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ආ)** දීප ව්‍යාප්ත සේවාවන් 06 ක් ඇතුළුව සේවාවන් 13 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 102,412 ක් වූ අතර, 2016 ජුනි 30 දින වන විට එයින් තනතුරු 8,544 ක පුරප්පාඩු පැවතුනු අතර වාර්ෂිකව පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි.

**3.8 විසඳා නොතිබුණු විගණන ඡේද**

**---------------------------------**

අමාත්‍යාංශයට අදාළව පසුගිය වර්ෂවල විගණකාධිපති වාර්තාවලින් පෙන්වා දුන් පහත සඳහන් අඩුපාඩුව අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2011 | 1.4 | බොරැල්ල කොටා පාරේ පිහිටි නිවාස 02ක ආගමික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන නමුත් 1996 මැයි 23දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එය පරිහරණය කරනු ලබන විහාරාධිපති ස්ථවිර වහන්සේගෙන් අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**3.9 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය යන සේවාවන්හි කාර්යක්ෂමතා කඩඉම් විභාග, විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟතාවය නොමැතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ඉවත් කර 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පැවැත්වීමට කටයුතු කර තිබුණි.
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන රහස්‍යභාවය හා ආරක්ෂිත ක්‍රමවේදයන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ක්‍රියාත්මක නොවීම, කඩඉම් විභාග වර්ෂයකට දෙවතාවක් නොපැවැත්වීමට සහ දෙපාර්තමේන්තුවට සාපේක්ෂව අපේක්ෂකයකු වෙනුවෙන් වැඩි මුදලක් අමාත්‍යාංශයට දැරීමට සිදුවීම යන කරුණු හේතුවෙන් මෙම තීරණය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) 2015 වර්ෂය තුළ විදේශ පුහුණු වැඩසටහන් 2 කට සහභාගී වී තිබූ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යවරයා, අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් සහ නිලධාරීන් 4 දෙනෙකු සඳහා නවාතැන් ගාස්තු, ආහාර පාන, ගමන් වියදම් සහ පාඨමාලා ගාස්තු ඇතුළු සියළු වියදම් ආදාළ ආයතන විසින් වැය කර තිබුණි. 2015 මැයි 15 දිනැති අංක 01/2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4(b)(i) ඡේදයට පටහැනිව සංයුක්ත දීමනා වශයෙන් රු. 1,549,511 ක් ගෙවා තිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 69 | 62 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 11 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 534 | 452 | 82 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 179 | 156 | 23 |
| | **එකතුව** | **799** | **681** | **118** |